පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- ගෘහ ආර්ථික විද්‍යාව

සතිය- 12

ශ්‍රේණිය :- 11

Prepared by- කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

## පුනරීක්ෂණ අභ්‍යාස

1. ආහාර පරිරක්ෂණ ක්‍රමවලදී යොදා ගන්නා උපක්‍රම නිවැරදි භාවිත කිරීමට අනුගමනය කළයුතු පියවර 04 කි දක්වන්න.
2. මාළු ඇඹුල් තියල් සෑදීම සඳහා සුදුසු මාළු වර්ග මොනවාද?
3. මාළු ඇඹුල් තියල් සෑදීමේදී ගොරකා යෙදීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද?
4. ආහාර පරිරක්ෂණයේ ඇතිඋපක්‍රමයක් වන බ්ලාන්ඩ් කිරීමෙන් ඇති වාසි 02ක් ලියන්න
5. අඹ චට්නි සාදන ආකාරය ගැලීම් සටහනකින් දක්වන්න.
6. ආහාර පරිරක්ෂණයේ ඇති වාසි 04ක් ලියන්න.
7. ගෘහ පිළි හඳුන්වන්න.
8. මැසීම සඳහා රෙදි නියැදි සැකසීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් ලියන්න.
9. විසිතුරු මැහුම් ක්‍රම 05ක් නම් කරන්න.
10. සිහින් රේඛා, කුඩා මල්, මල් පොහොට්ටු, රවුම් හැඩති කොළ මැසීමට යොදා ගත හැකි මැහුම් ක්‍රම දක්වන්න. ල.
11. සෙවනැලි මැස්මෙන් විවිධ මෝස්තරයන් නිර්මාණය කරයි. මෙම මැහුම් ක්‍රමය හඳුන්වන වෙනත් නමක් ලියන්න
12. වාටි අලංකාර කිරීමට යොදා ගන්නා මැහුම් ක්‍රම 4 සඳහන් කරන්න.
13. විවර පියවීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රම මොනවාද?



මෙම ක්‍රමයේ පියවර ලියන්න.

14. a. දෙපැති ජන්තුවල එක් සිදුරක් සඳහා ගැසිය යුතු මැස්ම ප්‍රමාණය කොපමණද?

    b. ඒ සඳහා භාවිතා කරන මැස්ම කුමක්ද?

15. විවරයේ දෙපසින් සමාන ප්‍රමාණයක් ඇතුලට නවා එම නැමුම් දාර ගාංචුවේ මැද්දට තබා බොරු නූල් ඇද ස්ථිර මැහුම යොදන්නේ කුමන විවරය පියවීමේදීද?
16. ඔබට කුෂන් කවරයක් නිර්මාණය කිරීමට අවස්ථාව ලැබුණි නම් එය නිර්මාණය කරන ආකාරය අනු පිළිවෙලින් ලියා දක්වන්න.
17. කුෂන් කවරය මැසීමේදී යොදා ගත හැකි මූට්ටු වර්ග මොනවාද?
18. කුෂන් කවරය සඳහා යොදා ගත හැකි අක් සැරසිලි නම් කරන්න.
19. බන්දේසි කවරයට පෝරුවක් යෙදීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද?
20. බන්දේසි කවරයෙහි අද්දර නිම කිරීමට සුදුසු අක් සැරසිලි ක්‍රමය ඇඳ දක්වන්න.